# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## නගර සහ ග්‍රාම නිර්මාණ (සංශෝධන)

**(269 වන අධිකාරය වූ) නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2011 නොවැම්බර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 ඔක්තෝබර් මස 17 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[136 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය* : මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) (269 වන අධිකාරය වූ) නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනතේ දීර්ඝ නාමය ප්‍රතිශෝධනය කරනු ලබන අතර එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ පනත යටතේ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ක්‍රියාකාරකම්වල විෂය පථය පුළුල් කිරීම මේ.

*3 වන වගන්තිය* : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතිශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ පනත යටතේ ප්‍රකාශයට පත්කරනු ලබන විවිධ ප්‍රදේශ, ප්‍රභේද ආරක්ෂා කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ කාර්ය සඳහා ජාතික භෞතික ප්‍රතිපත්තියක් සහ ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම සඳහා ජාතික භෞතික සභාවට නියම කිරීම වේ.

*4 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතිශෝධනය කරනු ලබන අතර එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ පනතේ විෂය පථය පුළුල් කිරීම වේ.

*5 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 6අ, 6ආ වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිවල නීතියේ බලපෑම වනුයේ පහත ප්‍රකාරව බුද්ධ ශාසන සහ ආගමික කටයුතු විෂයභාර අමාත්‍යවරයාට ඇතැම් ප්‍රදේශ "පූජනීය ප්‍රදේශ" වශයෙන් ප්‍රකාශයට පත්කිරීම සඳහා බලය ලබාදීම වේ.

*6 වන වගන්තිය* : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම පනත් කෙටුම්පතේ 4 වන වගන්තිය මඟින් කර ඇති සංශෝධනයට ආනුෂංගික වේ.

*7 වන වගන්තිය* : මේ වගන්තිය මගින් සංශෝධනයට පෙරාතුව මේ පනතේ 6 වන වගන්තියේ විධිවිධාන යටතේ කරගෙන යනු ලැබූ ඇතැම් ක්‍රියා සහ කටයුතුවල වලංගුභාවය සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

# නගර සහ ග්‍රාම නිර්මාණ (සංශෝධන)

එල්.ඩී.—ඕ. 42/2011.

## (269 වන අධිකාරය වූ) නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2011 අංක   දරන නගර සහ ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*269 වන අධිකාරයේ දීර්ඝ නාමය ප්‍රතිශෝධනය කිරීම.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (269 වන අධිකාරය වූ) නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ:—

"ශ්‍රී ලංකා දේශයේ ආර්ථික, සමාජයීය, ඓතිහාසික, පාරිසරික, භෞතික සහ ආගමික දෘෂ්ටීන් හා සම්බන්ධයෙන් ඒකාබද්ධ සැලසුම් පද්ධතියක් ප්‍රවර්ධනය කිරීමේ, ස්ථාපිත කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ අරමුණ ඇතිව ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ද; ප්‍රකාශිත අරමුණු බලාත්මක කිරීමේ කාර්යය සඳහා ජාතික භෞතික සැලසුමක් සකස් කිරීම සඳහා ද; අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම පහසු කරවීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.".

*(269 වන අධිකාරය වූ) නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රතිශෝධනය කිරීම.*

3. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (269 වන අධිකාරය වූ) නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

*"ජාතික භෞතික සැලසුම් සකස් කිරීම සහ එහි විෂය පථය සහ පනතේ අරමුණු.*

2. (1) මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික භෞතික සභාව විසින් මේ ආඥාපනත යටතේ, පහත නිශ්චිතව දක්වා ඇති පනතේ අරමුණු බලාත්මක කිරීමේ අරමුණින් එකී ප්‍රතිපත්තිය නිශ්චිතව දක්වනු ලබන ජාතික භෞතික ප්‍රතිපත්තියක් සහ ජාතික භෞතික සැලසුමක් සකස් කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

2—PL 006339—1,000 (2011/11)

(2) මේ පනතෙහි අරමුණ වනුයේ (එහි ගොඩනැගිලි තිබුණ ද, නොතිබුණ ද) ශ්‍රී ලංකා දේශයේ ආර්ථික, සමාජයීය, ඓතිහාසික, පාරිසරික, භෞතික සහ ආගමික දෘෂ්ටීන් සම්බන්ධයෙන් නිසි යටිතල පහසුකම්, පොදු පහසුකම් සහ පහසුකම් සහතික කිරීම සඳහා ඒකාබද්ධ සැලසුම් සහ සංවර්ධන පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය සහ ක්‍රමවත් කිරීම වන අතර, එකී කාර්ය සඳහා මෙම පනතේ ඉහතින් ම වූ විධිවිධාන ප්‍රකාරව—

(අ) “ආරක්ෂිත ප්‍රදේශ”;

(ආ) “සංරක්ෂණ ප්‍රදේශ”;

(ඇ) “වාස්තු විද්‍යාත්මක” හෝ “ඓතිහාසික ප්‍රදේශ”; සහ

(ඈ) “පූජනීය ප්‍රදේශ”,

ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.”

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතිශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබ, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

“ආඥාපනතේ කාර්ය සඳහා “ආරක්ෂිත ප්‍රදේශ”, “සංරක්ෂණ ප්‍රදේශ”, “වාස්තු විද්‍යාත්මක” හෝ “ඓතිහාසික ප්‍රදේශ” ප්‍රකාශයට පත් කිරීම.

6. ආඥාපනතේ අරමුණු බලාත්මක කරමින් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මහ නගර සභා ප්‍රදේශය ඇතුළත, නගර සභා ප්‍රදේශය ඇතුළත හෝ යම් ප්‍රධාන මාර්ග සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත යම් නිශ්චිත ඉඩම් ප්‍රදේශයක්—

(අ) ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා “ආරක්ෂිත ප්‍රදේශයක්” වශයෙන්;

(ආ) ස්වාභාවික පරිසරය සංරක්ෂණය කිරීම සඳහා සහ පරිසරයේ ඇති ස්වාභාවික සුන්දරත්වයෙන් යුතු ස්ථාන ආරක්ෂා කිරීම සඳහා “සංරක්ෂණ ප්‍රදේශයක්” වශයෙන්; හෝ

(ඇ) වාස්තු විද්‍යාත්මක සහ ඓතිහාසික වටිනාකමකකින් යුත් ගොඩනැගිලි සංරක්ෂණය සඳහා “වාස්තු විද්‍යාත්මක” හෝ “ඓතිහාසික ප්‍රදේශයක්” වශයෙන්,

ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.”

ප්‍රධාන ප්‍රඥප්තියට 6අ සහ 6ආ වගන්ති ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එකී ප්‍රඥප්තියේ 6අ සහ 6ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

“ආඥාපනතේ කාර්ය සඳහා “පූජනීය ප්‍රදේශ” ප්‍රකාශයට පත් කිරීම.

6අ. බුද්ධ ශාසන සහ ආගමික කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින්, භෞතික සැලසුම් විෂයය පවරා ඇති අමාත්‍යවරයාට දැනුම් දීමෙන් පසුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් යම් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත, යම් ප්‍රධාන මාර්ග සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත හෝ යම් ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත පිහිටි යම් නිශ්චිතව දක්වන ලද ඉඩම් ප්‍රදේශයක් එම ප්‍රදේශයේ ආරක්ෂාව සහ සංරක්ෂණ කාර්ය සඳහා “පූජනීය ප්‍රදේශයක්” ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

අරමුණු නිශ්චිතව දැක්වීම සහ සීමා මායිම් විස්තර කිරීම සඳහා වූ නියමය.

6ආ. (1) ආඥාපනතේ 6 සහ 6අ වගන්ති ප්‍රකාරව සාදනු ලබන සෑම නියමයක් ම මගින් එම නියමයන් සාදනු ලබන කාර්ය නිශ්චිතව දැක්විය යුතු අතර, එකී ප්‍රදේශයේ සීමා මායිම් පිළිබඳ විස්තරයක් අන්තර්ගත විය යුතු ය.

(2) පනතේ 21 වන වගන්තිය යටතේ වූ නියමයක්, ආඥාපනතේ 6 සහ 6අ වගන්ති ප්‍රකාරව ප්‍රකාශයට පත් කරන ලද යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(1) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයා විසින්, මේ කොටසේ ඉහතින් නියම වූ විධිවිධාන

යටතේ තත්කාර්යය සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්,—

(අ) ඕනෑම ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදේශයක් සඳහා “ප්‍රාදේශීය භෞතික සැලසුමක්” සකස් කරනු ලැබිය යුතු බවට; හෝ

(ආ) යම් සම්පූර්ණ නාගරික ප්‍රදේශයක් හෝ යම් ප්‍රධාන මාර්ග සංවර්ධන ප්‍රදේශයක් හෝ එහි යම් කොටසක් සඳහා “දළ භෞතික සැලැස්මක්” හෝ “විස්තරාත්මක සැලැස්මක්” පත් කරනු ලැබිය යුතු බවට,

විධාන කරනු ලැබිය හැකි ය.”.

වලංගුභාවය.

7. මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ඕනෑම කාලයක දී ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියමයක් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මේ පනතේ 6අ වගන්තිය යටතේ සාදන ලද “පූජනීය ප්‍රදේශයක්” වශයෙන් වූ යම් නිශ්චිත ප්‍රදේශයක් බවට ප්‍රකාශ කරනු ලබන නියමයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන සහ මේ පනත ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.